# එන ඔලිම්පික් උළෙලේ විධායක වගකීමක් ලද ශ්‍රීලාංකිකයා - සුජිත් වීරසිංහ

**2012** ඔලිම්පික් තරඟාවලියේ සත්කාරක රට වන මහා බ්‍රිතාන්‍යය ඒ සඳහා සැළසුම් සහගතව ලහි ලහියේ සූදානම් වනු පෙනේ. මේ අතර ශ්‍රීලංකාවේ ඔලිම්පික් කමිටු සභාපති හේමසිරි ප්‍රනාන්දු පසුගියදා ප්‍රකාශකර සිටියේ ලංකාවේ කිසිවෙකුත් ඔලිම්පික් තරඟාවලියට සහභාගිවීමේ පාරිසාධන ප්‍රමිතීන් (Elegible Standards) මේ වන තුරු සපුරා නොමැති බවයි. ඒ අනුව ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් හෝ නිලධාරීන් මෙවර ඔලිම්පික් උළෙලට පැමිණීම තවමත් අවිනිශ්චිත ය.

කෙසේ වුවද ලන්ඩනයේ වාසය කරන ශ්‍රීලාංකිකයෙකු 2012 ඔලිම්පික් තරඟාවලියේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියෙකු ලෙස පත්වීමෙන් ශ්‍රීලංකාවට ඔලිම්පික් සම්බන්ධ ප්‍රථම ගෞරවය ලැබී ඇත. ඔහු සුජිත් වීරසිංහය. ඔලිම්පික් තරඟාවලියේ ප්‍රධාන අනුග්‍රාහකයෙකු වන බ්‍රිතාන්‍ය ඛනිජ තෙල් සමාගම (BP-British Petroleum)තම ආයතනය මගින් ක්‍රීඩා උළෙලේ ඉටුකළ යුතු සියළුම මෙහෙයවීම් වල ප්‍රධාන විධායක වගකීම පවරා ඇත්තේ සුජිත් වීරසිංහ මහතා වෙතය. මේ වන විටත් ප්‍රධාන මෙහෙය වුම් ක්‍රියාන්විතයේ සිටින එකම ආසියා තිකයාද ඔහු වෙයි. උතුරු ලන්ඩනයේ වෙසෙන දෙදරු පියෙකු වන තරුණ සුජිත් බ්‍රිටිෂ් පැට්‍රෝලියම් ආයතනයේ පාරිභෝගික ප්‍රාන්ත කළමනාකාර තන තුර දරයි. කොළඹ ගල්කිස්සේ ඉපිද එහිම හැදුණු වැඩුණු සුජිත් සිප්සතර හැදෑරුයේ ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙනි. ඔහු 1992 වසරේ වැඩිදුර අධ්‍යාපනය හැදෑරීම සඳහා එක්සත් රාජධානියට පැමිණ ඇත.

බීපී සමාගම රටවල් 25ක ව්‍යාප්ත සිය ව්‍යාපාර ජාලයේ සේවය කරන කාර්‍ය මණ්ඩල සඳහා වාර්ෂිකව පවත්වන සේවක සම්මාන ප්‍රදානයේදී 2010 වසරේ ඉහළම ගෝලීය සම්මානය පිරිනමා ඇත්තේ සුජිත් වීරසිංහටය. සුරක්ෂිත භාවයෙන් යුතුව සේවා සැපයීම හා සාමූහික වගකීමේ පුරෝගාමීත්වය තේමා කරගෙන පිරිනමා ඇති එම ගෝලීය සම්මානය සඳහා සුජිත් වීරසිංහ තෝරා ගෙන ඇත්තේ අවසාන නාම යෝජනා 210 ක් අතුරින්ය. මෙම ගෝලීය සම්මානය ලද නිසාම 2012 ඔලිම්පික් තරඟා වලියේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි තනතුරක්ද බීපී වෙතින් ඔහුට පිරිනැමිණ. එසේම ඔලිම්පික් උළෙලට අනුයුක්ත 4000 කින් පමණ සමන්විත ප්‍රවාහන සංචිතයේ ඉන්ධන සැපයීම, සේවා හා නඩත්තු කාර්‍යයන් හි වගකීම සුජිත්ගේය. ඔලිම්පික් ගම්මානයේද, විවිධ ක්‍රීඩා ඉසව් පවත්වන ස්ථා නවලද, ප්‍රධාන පාලක මණ්ඩලයේද, අනේකවිධ උත්සව අවස්ථාවන්හිදී ද සුජිත් වීරසිංහ විධායක වගකීමක් ඉසිලීම ශ්‍රීලාංකික අප කාටත් ආඩම්බරයකි. මෙම ක්‍රියාශීලී ප්‍රසන්න ගතිපැවතුම් ඇති සිංහළ තරුණයාට අපි ඉත සිතින් සුබ පතමු!



Sujith Weerasinghe
සුජිත් වීරසිංහ BP වෙතින් පිරිනැමුණු ගෝලීය සම්මානය සමග

♦ මේජර් වී. බී. කරුණාරත්න
Oxford UK

## ඇත්ත කෙටි කතාව ලුම්බිණියට ලවුඩ්ස්පීකර් සැපයුවෙමි

**ඒ** මා උසස් පෙළ ප්‍රතිඵල ලැබ රස්තියාදු ගසමින් සිටි කාලයයි. සයිමන් නවගත්තේ ගමගේ නාට්‍ය පසුපස ගිය කාලයයි. සෙරෙප්පු ගෙවෙනතුරු පයින් ඇවිදිමින් සිටි කාලයයි. තවම නීති විද්‍යාලයට ඇතුල්වී නොමැත. මෙසේ ගතවුවහොත් මගේ ගන්න දෙයක් ඉතුරුවන්නේ නැතැයි අනුකම්පා කළ මගේ මස්සිනා වූ රන්ජිත් පළන්සූරිය ඔහු සතුව තිබූ ශබ්දවිකාශන යන්ත්‍ර, පටිගත කරන යන්ත්‍ර, සිනමා ප්‍රොජෙක්ටර් හා ගීත තැටි ගණනාවක් ලබාදී ඔහුගේම වියදමින් කොල්ලුපිටියේ ගාලුපාරේ අංක 301 හි රෙකෝර්ඩ් බාර් එකක් සාදා මට භාර කරවීය. **WAVES** එහි නමයි. එකල ගී තැටිවලින් පටිවලට පටිගතකරන කොළඹ වූ ව්‍යාපාර තුන හතරෙන් එකක් අපිද වීමු. ජැන්ඩියට ඇඳ පැළඳ ඉංග්‍රීසියෙන්ම කතා කරන තරුණ කණ්ඩායම් නිතර එහි ගැවසුණ අතර ඔවුන් අතර මා තදින් සිත්ගත් පුද්ගලයෙකුද විය. මා ඔහු ලකී නමින් දැන සිටි අතර පසු කලෙක ලකී ඩයස් නමින් ප්‍රසිද්ධියට පත්වූ යේ ඔහු ය.

මෙම රෙකෝර්ඩ් බාරය විවෘතකරන ලද්දේ මහාචාර්‍ය සුනිල් ආරියරත්නයන් විසිනි. එවකට ඔහු සහාය කථිකාචාර්‍යවරයෙකි.

මෙම ව්‍යාපාරය කරන අතරතුර වූ අමතක නොවන සිදුවීම් කීපයක් ඇත. එයින් වඩාත්ම සිතේ රැඳී සිටි අවස්ථා දෙකක් මෙහි සඳහන් කරන්නෙමි.

මා ව්‍යාපාර කළ ගොඩනැගිල්ල අයත් මහතාගේ බිරිඳ කොළඹ හැව්ලොක්ටවුමේ ලුම්බිණී විදුහලේ ගුරුවරියක වූවාය. එහි එවක විදුහල්පතිව සිටියේ ලයනල් සරත් නම් සුප්‍රසිද්ධ වාමාංශික දේශපාලනඥයාය. ලුම්බිණී විදුහලේ වාර්ෂික ක්‍රීඩා උළෙලට ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීමේ කොන්ත්‍රාත්තුව මට ලැබුණි. සාමාන්‍ය තරමේ ස්පීකර් දෙකක්, ඇම්ප්ලිෆයරයක් සහ මයික් දෙකක් අප සතුවිය. අපේ මට්ටමට එය හොඳටම ප්‍රමාණවත්ය. ආම්පන්න සියල්ල බසයක දාගත් මාත්, මගේ සහායක චන්ද්‍රාත් දහවල් 12 වනවිට උත්සවය තිබෙන හැව්ලොක් පිටියට සේන්දු වුනෙමු. උළෙල ඇරඹෙන්නේ දහවල් 2 ට ය. ලහි ලහියේ වයර් ඇදීම් කටයුතු නිමවා ස්පීකර්ස් දෙක පිට්ටනියේ දෙපළක වූ තරමක් උස කණු දෙකක ගැට ගැසුවෙමු. දැන් සියල්ල සූදානම් ය. ශබ්දය පරීක්ෂා කරන්නට සහායකයා එක් ස්පීකර යක් ළඟට යවා මම මයික් එක ගෙන හලෝ හලෝ යයි කීවෙමි. එහෙත් ලවුඩ්ස්පීකර් ශබ්දයක් ඉන් නිකුත්වන බවක් මට නැසේ. ඈත ස්පීකරය ළඟට ගිය මගේ සහායකයා කිසිවක් ඇසෙන්නේ නැතැයි මට අතින් සඥාවක් කර පෙන්වීය. ඒ මේ අත දුවමින් ඇම්ප්ලිෆයරයේ වයර් ගලවමින්, යළිත් වෙනත් විදියට සවිකරමින්, විශාල විශාල මහන්සියක් දැරුවත් නිකුත්වූ ශබ්දය යාන්තම් කෙඳිරුම් හඬක් පමණි.



මේ අතර දැන් ටික ටික ගුරුන්ගෙන් හා සිසුන්ගෙන් හැව්ලොක් පිටිය පිරෙමින් පැවතිණ. තවම අපේ ශබ්ද විකාශනය සිදුවන්නේ නැත. විදුහල්පතිතුමා එහි පැමිණ කොහොමද දැන් වැඩේ හරිදැයි මගෙන් විමසී ය.

මම හිස සොළවා එය හරි සහ හරි නැත අතර සඥාවක් කළෙමි. ඒ අතර ඉස්කෝලෙ හාමිනේලා පැමිණ නන්දා මලානීගේ සිංදුවක් දාන්නකෝ යයි කියයි. මගේ ඇඟ අප්‍රාණික විය. වෙව්ලනවාක් මෙන් දැනිණ. ක්‍රීඩා උළෙල තව ටිකකින් ආරම්භ කළ යුතුය. සිතිවිල්ලක් ක්ෂණය කින් මසිතට නැගිණ. සහායකයාටද නොකියා එක්වරම පිටියෙන් පිටතට දුව ආ මා ටැක්සියක් නවත්වා වහාම ඇස්-වාට්ටුවේ පරාක්‍රම රේඩියෝ වෙත මා ගෙන යන ලෙස රියැදුරාට දැන්වීමි.

ටැක්සිය ගොස් නවත්වනවාත් සමග "ඩ්‍රයිවර් උන්නැහේ යන්න එපා ඔහොමම ඉන්න" යයි පවසා මම පරාක්‍රම රේඩියෝ ගොඩනැගිල්ල තුළට දුවගෙන ගියෙමි. එහි සිටි අයට මට වූ අකරතැබ්බය පවසා උදව් ඉල්ලා සිටියෙමි. එහි සිටි තැනැත්තා කියා සිටියේ තිබෙන හොඳම උපකරණ උත්සව කීපයකට ගෙන ගොස් ඇති නිසා ඉතිරිව තිබෙන එක එතරම් හොඳ එකක් නොවන බවයි. එහෙත් ඔහුට දණගසා වඳින්නට සැරසෙන මා දුටු ඔහු කීවේ "මේක ඕනනම් ඇවිත් සෙට්කරලා දෙන් නම් හැබැයි රුපියල් 150 ක් ඕන" යනුවෙනි. මා සන්තකටම තිබුණේ එයට මඳක් වැඩි මුදලකි. මම රුපියල් 150 ක් ඔහු අත තැබීමි. අර හොඳ නැතියි කී යන්ත්‍රයත් පරාක්‍රම රේඩියෝ මැනුත් සමග මම ආ ටැක්සියටම නැගී වහාම හැව්ලොක් පිටියට ඉගිල්ලෙන ලෙස රියැදුරු තැනගෙන් ඉල්ලා සිටියෙමි. ඔහුද එය අකුරටම ඉටු කළේය.

උත්සවය ආරම්භ කරන්නට තව විනාඩි දහයකට වඩා නැත. පරාක්‍රම හාදයා සමග වහා ගෙන ආ ඇම්ප්ලිෆයරය දඩිබිඩි ගා වයර් ඇද ක්‍රියාත්මක කරමින් මයික් එක ගෙන හලෝ යයි කීවේය. අර හරි නැතැයි කී ශබ්ද විකාශන යන්ත්‍රය පිට්ටනි හතක් වුවද හොළවන්නට සමත් නේදැයි මට සිතිණ.

වැඩේ කරදරයක් නැතුව හොඳින් අවසන් වුණේය. මගේ සහායකයාත් මාත් හැව්ලොක් පාරට පැමිණ කඩේකින් ප්ලේන්ටියක් බී අපේ බඩු ටිකත් පටවා ගෙන බසයෙන් කොල්ලුපිටියට ආවෙමු.

ලුම්බිණී විදුහලෙන් ලැබුණු රුපියල් හැත්තෑපහත් මගේ අතින් තවත් රුපියල් හැත්තෑපහක් ද දමා පාසැල් ක්‍රීඩා උළෙලකට ශබ්දවිකාශන යන්ත්‍ර සැපයූ බව මතක්වන විට දැනෙන්නේ පාඩුවක් වුණා යන්න නොව යන්තම් ගැලවුණා යන්නය. පසු කලෙක දී කලකට පෙර අභාවප්‍රාප්ත දයානන්ද ගුණවර්ධන ශූරීන්ගේ ගජමන් පුවත නාට්‍යයේ පළමු දර්ශනේ සිට සියලුම දර්ශනයන්ට ශබ්ද විකාශණ යන්ත්‍ර සැපයීම ලැබුණේ මටය.

නීතිඥ
අනුර හෑගොඩ



## Channel 4
## බින් ලාඩන් මැරූ හැටි ලොවට පෙන්නයි! එහෙත් ඇමරිකාවට යුද අපරාධ චෝදනා නැත !



**President Obama, Hilary Clinton and the White House officials tensely watch the live satellite video sent to them by the US Navy Seal team who were sent to Pakistan on a mission to assassinate Al Qaeda leader Osama Bin Laden.**

**ර්**යෙ **7** වෙනිදා බ්‍රිතාන්‍ය රූපවාහිනියේ චැනල් **4** නාලිකාවෙ රෑ **9** ට පෙන්නුවා ඇමරිකානු නාවික හමුදා විශේෂ කණ්ඩායමක් (US Navy Seal Team) පකිස්ථානයට ගිහිං අල්කයිඩා නායක ඔසාමා බින්ලාඩන්ව ඝාතනය කරපු හැටි. ඒ චැනල් **4** පෙන්වූ වැඩ සටහනේ නම - **Bin Laden - Shoot to Kill**

ජනාධිපති ඔබාමා ඇතුළු ධවල මන්දිරයේ නිලධාරීන් කීප දෙනෙක් සහ ඒ එදා ඝාතනය සඳහා ගිය නාවික කණ්ඩායමේ කීප දෙනෙක්ද සිදුවූ හැටි වරින් වර විස්තර කළා. කොතරම් සුපරීක්ෂාකාරීවද එය සිදු කළේ කියලා කියන අතරේ ඇමරිකාවේ යුද උපකරණ පිළිබඳ දැනුම හා ඒ කණ්ඩායම සටනට හුරුවන අන්දමත් පෙන්නුවා. පකිස්ථානයට කණ්ඩායමක් යැවූ බවත් දැන් ඒ අය එහි ක්‍රියාකාරීව සිටින බවත් කාටවත් නොකියා හිතවත් කීපදෙනෙකුට පමණක් කියූ බව ඔබාමාගේ සාකච්ඡාවේදි ඔහු විස්තර කළා. රහස එළිවෙලා පකිස්ථානු රජයට ආරංචි වුනොත් වැඩේ ගැස්සිලා යාවිය කියන බයත් තිබුණු බව ඔහුගේ කතාවෙ සඳහන් වුණා.

එය පකිස්ථානෙ වැඩිය ගෙවල් නැති පාළු තැනක තිබුණු යාව තැනූ නිවාසවලින් යුත් බිල්ඩිමක්. කටුකම්බිවලින් වටකරලා තිබුණා. කවුරුවත් ඒතුළ ඉන්න බවක් කිසිම වෙලාවක පෙනිලා නැහැ. කොහෙන් හෝ ලැබුණු ආරංචියක් මිසක බින් ඒක ඇතුළෙ ඉන්නවද කියලා ඇමරිකාව හරියටම දැනං හිටියෙ නැහැ. සැටලයිට් පින්තූර වලට රැවුල තියන කෙනෙක් එහෙ මෙහෙ වෙනවා නිකං ඡායාවකින් වගේ පෙනුණා මිසක් හරියටම ඒ බින් ලාඩන්ද කියලා නිශ්චිතව කියන්න කාටවත් බැරිවුණා.

නාවික සීල් කණ්ඩායම මූදෙ ඇමරිකන් නැවක ඉඳලා හෙලිකොප්ටර් දෙකකින් ගිහිං ඒ බිල්ඩිමට ඇතුළ් වුණා. බිනාගෙ සහායකයො දෙන්නෙක් හිටියා. උන්ට වෙඩි තිව්වා. එතකොටම කාමරේක ඉඳලා කෑගහගෙන ගෑණු කෙනෙකුයි ළමයි දෙන්නෙකුයි එළියට ආවා. උන්ව පැත්තකට කරලා නාවිකයෙක් කාමරේට පැන්නා. වෙඩිහඬවල් කීපයක් ඇහුණා. වැඩේ ඉවරයි.

ඔබාමා කිව්වා බින්ගෙ මිනිය නෑයින්ට භාරනොදී මූදට දැම්මෙ ඔහු වළලන්න දුන්නොත් ඒ සොහොන ඊට පස්සෙ මුස්ලිම් අය වැඳුම් පිදුම් කරන තැනක් වේවි කියලා හිතූ නිසාය කියලා.

ඔබාමා මුලදිම කිව්වා ඒ ඔපරේෂන් එක සැළසුම් කළේ කෙලින්ම බිනිලාඩන්ව මරන්නම ය කියලා. **Bin Laden - Shoot to Kill** යනුවෙන් ඒක නම් කළේ ද ඒ නිසාමයි. අවශ්‍ය නම් නාවික කණ්ඩායමට තිබුණා බින්ව නොමරා අල්ලගන්න. නමුත් ඔවුන්ට ඇමරිකාව දීල තිබුණු නියෝගය " ඌව ඉතුරුකරන්න එහෙම එපා" කියලයි. ඔබාමා ලෝකයා අමතා එදා ප්‍රවෘත්තිය දුන්නෙ " මිත්‍රවරනි, අපි අද බින්ලාඩන්ව මැරුවා " කියලයි.

චැනල් **4** න්‍යාය අනුව බැලුවොත් ඇමරිකාව කළේ ඒ යුද අපරාධයක් නෙවෙයිද? ඔබාමාගේ කටින්ම කියනව නේද " අපි මරන්නමය නියෝගය දුන්නෙ, අපි මැරුවා " කියලා. ඒක යුද අපරාධයක් නෙවෙයිද? අවුරුදු **30** ක් තිස්සේ ලංකාවෙ දහස් ගණනක් මිනිස්සු මරාදාපු ප්‍රභාකරන් ඇතුලු කොටි ත්‍රස්තවාදී නායකයො සටනෙදි මැරුවම ඒක විතරක් යුද අපරාධ වුණේ කොහොමද? මුන්ගෙන් මේව අහන්න කවුරුවත් නැත්තෙ ඇයි ?

♦ වෙලේගෙදර රාළ London